# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. } 3/1/6 | ඔබේ අංකය / உமது இல / Your No } | දිනය / திகதி / Date } 2020.02.03 |

චක්‍රලේඛ අංක 2008/04 (1)

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු

ඉඩම් කොමසාරිස් / සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

## <u>රජය සතු ඉඩම් අනවසරයෙන් අල්ලාගැනීම පාලනය කිරීම හා කළමනාකරණය විධිමත් කිරීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මගේ අංක 2008/04 හා 2008.08.20 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

රජයේ ඉඩම් අවිධිමත්ව භුක්තිවිඳින්නන් විනිවිදභාවයකින් යුක්තව ලියාපදිංචි කර විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ඔවුන් වෙත ඉඩම් හිමිකම සම්බන්ධයෙන් නීත්‍යානුකූල ලේඛනයක් ලබාදීමත්, රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගැනීම වැළැක්වීමත්, රජයේ ඉඩම් කළමනාකරණය විධිමත් කිරීමත් යන අරමුණින් එම චක්‍රලේඛය නිකුත් කර ඇත. එසේ වුවද එම චක්‍රලේඛය අනුව ඉටු කළ යුතු රාජකාරි තවදුරටත් ක්ෂේත්‍රය තුල පවතින බව අනාවරණය වී ඇත. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් හා පළාත් ඉඩම් කොමසාරිස්වරුන් සමඟ සාකච්ඡා කිරීමේදී අනාවරණය වූයේ මෙම චක්‍රලේඛයේ පවතින ඇතැම් වගන්තිවල සංකීර්ණතා හේතුවෙන් චක්‍රලේඛයේ අපේක්ෂිත අරමුණු සියල්ල ළඟා කරගැනීමට අපහසු වී ඇති බවයි. ඒ අනුව එයට පිළියමක් ලෙස 2008/04 චක්‍රලේඛයේ 1 කොටසේ 1.2 හා 1.3 හි අඩංගු කරුණු පරිශීලනයේ පහසුව සඳහා පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

01. රජයේ ඉඩමක් සම්බන්ධයෙන් පුද්ගලයෙකුගෙන් ලැබෙන ඉල්ලීමක් ඕනෑම අවස්ථාවක භාරගැනීමට කටයුතු කළ යුතු අතර එහිදී, නව ඉඩම් ඉල්ලීම් එක් ලේඛනයකත්, රජයේ ඉඩම් අවිධිමත්ව පරිහරණය කරන්නන් තවත් ලේඛනයකත්, ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ඇතුලත් කිරීමට කටයුතු කරන්න.

02. I නව ඉඩම් ඉල්ලීම් සඳහා ප්‍රදේශයේ එම ඉල්ලීම්වලට සරිලන භූමි ප්‍රදේශ තිබේනම් ඒවා හඳුනාගෙන ඉඩම් සංවර්ධන ආඥා පනත හෝ රජයේ ඉඩම් ආඥා පනත අනුව අදාල පියවරයන් අනුගමනය කිරීමට කටයුතු කරන්න.

II රජයේ ඉඩම් අවිධිමත්ව පරිහරණය කරන්නන්ගේ ලේඛනයේ සඳහන් ඉඩම් කඩිනමින් පරීක්ෂා කරන්න. එහිදී එම ඉඩම බැහැර කළ හැකි ඉඩමක් ද යන්න එම පරීක්ෂාවේදී හඳුනාගත යුතු අතර ඉදිරි කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට සංවර්ධන වාර්තා සම්පූර්ණ කර ගත යුතුය. මේ සඳහා එල්සීඩී 02 ආකෘතිය භාවිතා කළ හැකි වේ. ක්ෂේත්‍ර පරීක්ෂණ අවස්ථාවේ වුවද පුද්ගලයකුගෙන් ඉඩම් ඉල්ලීමක් ලද හොත් එය ද ලියාපදිංචි කිරීමට කටයුතු කරන්න.

III ඉන්පසු බැහැර කළ හැකි ඉඩම් සඳහා සංවර්ධන වාර්තා සකස් කර ඉඩම් කච්චේරි සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් / පළාත් ඉඩම් කොමසාරිස් ගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන්න. මෙහිදී රජයේ ඉඩම් බැහැර කිරීමේ විනිවිදභාවයත්, කාර්යක්ෂමතාවයත් වර්ධනය කරගැනීම සඳහා රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (e-Slims) භාවිතා කරන්න.

IV ඉඩම් සංවර්ධන ආඥා පනතේ දක්වා ඇති පරිදි ඉඩම් කච්චේරි පවත්වා සුදුසුකම් ලබන්නන්ගේ මූලික ලැයිස්තුව සකස් කර ප්‍රසිද්ධ කරන්න. එහිදී 2008/04 චක්‍රලේඛයේ සඳහන් පරිදි විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා දින 14ක කාලයක් විවෘත කර තැබිය යුතුය. ඉන් අනතුරුව විරෝධතා ලැබී තිබේ නම් විරෝධතා ලැබීමේ කාලය අවසන් වන දින සිට දින 14ක් තුල විරෝධතා පරීක්ෂණ අවසන් කර අවසන් තේරීම් ලැයිස්තුව සකස් කර ඉඩම් කොමසාරිස් ජනරාල් / පළාත් ඉඩම් කොමසාරිස් ගේ අනුමැතිය ලබා ප්‍රසිද්ධ කළ යුතුය. එම ලේඛනය පළාත් ඉඩම් කොමසාරිස් විසින් අනුමත කරනු ලබන විට අවසන් තේරීම් ලැයිස්තුවල පිටපතක් ඉදිරි කටයුතු පහසු කරගැනීම සඳහා මා වෙත එවීමට කටයුතු කරන්න.

03. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පවත්වනු ලබන ඉඩම් කච්චේරි සඳහා අවසන් තේරීම් ලැයිස්තුව ප්‍රසිද්ධ කර මාස 03ක් ඇතුලත බලපත්‍ර සකස් කිරීමේ කටයුතු අවසන් කළ යුතුවේ.

04. රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කච්චේරියකින් සුදුසුකම් ලබන අයවලුන්ගේ බදු නිර්දේශ වාර්තා එවීමේදී, බදු සම්බන්ධ ඉදිරි කටයුතු කිරීමට පහසුවනු පිණිස සුදුසුකම් ලැබූ අවසන් තේරීම් ලැයිස්තුවේ සියළුදෙනාගේම බදු නිර්දේශ එකවර එවීමට කටයුතු කරන්න. එහිදී මැනුම් කටයුතු කිරීමටත්, තක්සේරු වාර්තා කැඳවීමටත් පහසුවනු ඇත. කෙසේ නමුත් මාස 05ක් තුලදීවත් ඔවුන්ගේ බදු අනුමැතින් ලබාදීමෙන් බදුකරුවන්ට මෙන්ම රජයේ ආදායම් එකතු කිරීමට පහසුවක් වනු ඇත.

එසේම රජයේ ඉඩම් ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් "ඉඩම" ඵලදායී ආර්ථික ඒකකයක් ලෙස යෙදවීමටත්, සෑම පුද්ගලයෙකුගේම ඉඩම් හිමිකම තහවුරු කිරීමත් සඳහා සීමිත ඉඩම් සම්පත බෙදා දීමේදී, උපරිම සීමා දැක්වීම කාලෝචිත අවශ්‍යතාවයක් වී ඇත.

එහිදී 2008/04 චක්‍රලේඛයේ සඳහන් උපරිම සීමා සඳහා අවධානය යොමු කළ යුතු අතර පදිංචිය සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී ඉඩම් සීමාකාරී සාධකයක් බැවින් උපරිමය පර්චස් 20 කට සීමා කළ යුතු අතර අවම සීමාව වෙනුවෙන් පළාත් පාලන ආයතනයේ අවම සීමාව යොදා ගත යුතුවේ. එහිදී අවිධිමත්ව පරිහරණය කරන ඉඩම් සම්බන්ධයෙන් මෙම සීමා සැලකිල්ලට ගැනීමේදී මාගේ 2018/03 හා 2018.10.10 දිනැති චක්‍රලේඛයේ පවතින ප්‍රතිපාදන අනුගමනය කළ හැකිය.

කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් බෙහැර කිරීමේදී 2008/04 චක්‍රලේඛයේ 2.4 හි සඳහන් පරිදි පළාත් සභාව විසින් දැනටමත් ප්‍රඥප්තියකින් සම්මත කරගෙන ඇති ප්‍රමාණයට සීමා විය යුතුය. අන්තර් පළාත් බල ප්‍රදේශවල මාගේ 03/සං/2/1 හා 2009.03.16 දිනැති ලිපියේ ලබා දී ඇති සීමාවන් තුල දැනට ඉඩම් බෙදා දීම සිදුවන අතර, එහිදී එම අන්තර් පළාත් බල ප්‍රදේශවල සීමාවන් එම අන්තර් පළාත පිහිටි පළාත් සභා ඉඩම් සීමාවන් අතර විෂමතාවයක් පවතින බව ලැබෙන ඉල්ලීම් හා ක්ෂේත්‍ර රාජකාරිවලදී ඇතිවන තත්ත්වයන් වලදී නිරීක්ෂණය වී ඇත.

එබැවින් අන්තර් පළාත් කලාප තුල පිහිටි ඉඩම් සඳහා ද එම ඉඩම් පිහිටි අදාල පළාත් සභාව විසින් භාවිතා කරන උපරිම සීමා යොදා ගත යුතු අතර එය 2020.01.01 දින සිට යොදා ගත යුතුවේ.

වාණිජ කටයුතු සඳහා බැහැර කරනු ලබන ඉඩම්වලින් උපරිම ප්‍රතිඵල ලබාගැනීමට නොහැකිවූ අවස්ථාත්, එම ඉඩම්වලින් බදු ආදායම් ලබාගැනීමට අපහසුවූ අවස්ථාත් අනාවරණය වී ඇති බැවින් වාණිජ කටයුතු සඳහා බැහැර කළ යුතු ඉඩම්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම සඳහා ඉඩම් කච්චේරිවලින් වාණිජ කටයුතු සඳහා ලබා දිය යුතු උපරිම සීමාව තීරණය කිරීම කාලෝචිත බැවින්, 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් කච්චේරිවලින් වාණිජ කටයුතු සඳහා බැහැර කළ යුතු ඉඩම් ප්‍රමාණය පර්චස් 40කට සීමා කරන්න.

ඉහත පියවරයන් අනුගමනය කරමින් 2008/04 චක්‍රලේඛයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඉහත පරිදි අදාල පියවරයන් අනුගමනය කරමින්, ලබා දිය යුතු විධිමත් ලේඛන ලබාදීම මෙම චක්‍රලේඛය නිකුත් කර වසර 02ක් තුල අවසන් කළ යුතු අතර, රජයේ ඉඩම් ආරක්ෂා කරගැනීම සඳහා නිසි පියවර ගැනීමට කටයුතු කළ යුතුවේ. එතුලින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් කළමනාකරණය කරගැනීමට හැකිවනු ඇත.

මෙම චක්‍රලේඛය ලද බව දන්වන ලෙස ද මේ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් අවශ්‍යවේ නම් මා විමසීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත්:

01. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
02. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
03. සියළු දිස්ත්‍රික් ලේකම්වරුන්
04. අධ්‍යක්ෂ ජනරාල්, මහවැලි අධිකාරිය
05. මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව

} කාරුණික දැන ගැනීම සඳහා